මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහනේ - 2 ව්‍යාපෘතිය - 2022

---

මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහනේ - 2 ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2014 ජුනි 03 දින එළඹි අංක 3029 සහ 3030-එස්ආර්අයි(එස් එෆ්) දරන ණය ගිවිසුමේ II පරිච්ඡේදයේ 2.10 (අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කල යුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ව්‍යාපෘති හා ණය ගිවිසුම් වලට අනුව, එවකට ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය, වර්තමානයේ ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය වැඩසටහන ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මහ කොළඹ ප්‍රදේශයේ ජල සම්පාදන හා අපජලය සේවා පිළිබඳ කාර්යක්ෂමතාවය හා මූල්‍ය තිරසාරත්වය වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම් අනුව, ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 15,340 කට සමාන එ.ජ.ඩො.මිලියන 118 ක් වූ අතර ඉන් රු.මිලියන 9,100 හෝ සියයට 59.3 කට සමාන එ.ජ.ඩො. මිලියන 70 ක් ආසියානු සංවර්ධන බැංකුවේ සාමාන්‍ය ප්‍රාග්ධන සම්පත් මගින් මූල්‍යයනය කිරීම සඳහා හා රු.මිලියන 2,340 හෝ සියයට 15.3 කට සමාන එ.ජ.ඩො. මිලියන 18 ක් ආසියානු සංවර්ධන අරමුදලෙන් මූල්‍යයනය කිරීම සඳහා එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන රු.මිලියන 3,900 හෝ සියයට 25.4 කට සමාන එ.ජ.ඩො. මිලියන 30 ක් ශ්‍රී ලංකා රජය විසින් දායක වීමට අපේක්ෂා කර තිබුණි. තවද, වැඩසටහනේ මුළු ඇස්තමේන්තුගත පිරිවැයෙන් රු.මිලියන 13,917 කට සමාන එ.ජ.ඩො. මිලියන 107.05 ක් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් සිදු කිරීමට අපේක්ෂිත වැඩසටහනේ කාර්යයන් සඳහා වෙන් කර තිබූ අතර රු.මිලියන 1,423 කට සමාන එ.ජ.ඩො. මිලියන 10.95 ක් කොළඹ මහනගර සභාව විසින් සිදු කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති කාර්යයන් සඳහා වෙන්කර තිබුණි. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතියේ කාර්යයන් පිළිබඳ නිරීක්ෂණයන්ගෙන් මෙම වාර්තාව සමන්විත වේ. ව්‍යාපෘතිය එහි කාර්යයන් 2014 සැප්තැම්බර් 03 දින ආරම්භ කරන ලද අතර 2019 ජුනි 30 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. පසුව, 2022 ඔක්තෝම්බර් 24 දක්වා ව්‍යාපෘති කාලය දීර්ඝ කර තිබුණි.

## 1.3 තත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.1 හි විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, වැඩසටහනේ ව්‍යාපෘති 2 හි 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහයන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයන් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

## 1.4 තත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීමයන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරන ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

**1.6** මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස වැඩසටහනේ ව්‍යාපෘති 2 හි අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2.** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**2.1** ගිනුම්කරණ අඩුපාඩු

| අංකය | ගිණුම්කරණ අඩුපාඩු/ නිරීක්ෂණය | වටිනාකම රු. මිලියන | කළමණාකරණයේ අදහස් දැක්වීම | විගණන නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | අයිසීබී 04 හි ප්‍රධාන කොන්ත්‍රාත්කරු වෙත විදේශ සංරචකය යටතේ ලබා දෙන ලද වැඩ පූර්ව අත්තිකාරම් රුපියල් මිලියන 745 ට සමාන ඇමරිකානු ඩොලර් මිලියන 2 ක ප්‍රමාණය සහ විදේශ විනිමය විචලනය රු. මිලියන 689ක් මූල්‍ය ප්‍රකාශනයට ගෙන නොතිබුණි. | 1,434 | 2023 වර්ෂයේදී අදාළ වටිනාකම ජ්නල් සටහනක් මගින් නිවැරදි කිරීමට කටයුතු කර ඇත. | ඉදිරියේදී මෙවැනි ගිණුම්කරණ අඩුපාඩු ඇති නොවීමට පියවර ගත යුතුය |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | උප කොන්ත්‍රාත්කරුවන් 03 දෙනෙකුට විදේශ මුදල් වලින් ලබා දුන් වැඩපූර්ව අත්තිකාරම්වලට අදාළ විනිමය අනුපාත විචලතාවල මුළු වටිනාකම විනිමය අනුපාත උච්චාවචන ගිණුමට බැර කිරීම වෙනුවට සිවිල් වැඩ ගිණුමට බැර කර තිබුණි. | 285 | ජ'නල් සටහනක් මගින් 2023 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කර ඇත | ඉදිරියේදී මෙවැනි ගිණුම්කරණ අඩුපාඩු ඇති නොවීමට පියවර ගත යුතුය |

**2.2** නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.

| අංකය | නීති රීති සහ රෙගුලාසි වලට යොමුව | විගණන නිරීක්ෂණය | කළමණාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජන රජයේ මුදල් රෙගුලාසි අංක 502(2). | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන නොතිබුණි. | සියලුම වත්කම් ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ තාවකාලිකව පවතින බැවින් සහ වරින් වර එම වත්කම් ප්‍රධාන කාර්යාලයට මාරු වන බැවින්, ඉන්වෙන්ට්‍රි ලේඛණයක් පවත්වාගෙන යයි. | මූල්‍ය රෙගුලාසිවලට අනුකූලව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යා යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජන රජයේ මුදල් රෙගුලාසි අංක 128(1) ඉ,<br><br>507 සහ 756 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට පෙර වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය අවසන් කළ යුතු වුවද, විගණිත දිනය වන 2023 අප්‍රේල් 10 වන විටත් විගණන දිනය වන විටත් එය සිදු කර නොතිබුණි. | සෑම වසරකම භාණ්ඩ සමීක්ෂණය සිදු කරනු ලැබේ. අදාළ ලේඛනය ඉක්මනින් එවීමට කටයුතු කරනු ලැබේ. | නීති රෙගුලාසිවලට අනුකූලව කටයුතු කිරීමට පියවර ගත යුතුය. |

**3.** භෞතික කාර්ය සාධනය

**3.1** ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

ව්‍යාපෘතිය 2014 සැප්තැම්බර් 03 දින සිය කටයුතු ආරම්භ කළ අතර මූලික ගිවිසුමට සහ ක්‍රියාත්මක කිරීමේ සැලැස්මට අනුව 2019 ජුනි 30 වන විට කටයුතු අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ නමුත් කළමනාකාරීත්වය අපේක්ෂිත ඉලක්කය සපුරා ගැනීමට අපොහොසත් වූ අතර 2022 ඔක්තොම්බර් 22 දක්වා ව්‍යාපෘතියේ කාලසීමාව දීර්ඝ කිරීමට සිදුව තිබුණි. දීර්ඝ කල කාලසීමාවෙන් පසු මාස දෙකක් ගතවී ඇතත්, සමාලෝචිත වර්ෂය අවසානයේ ව්‍යාපෘතියේ සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 89.92ක් සහ සියයට 83.28ක් විය. 2022 ප්‍රගති වාර්තාව සහ විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව කොළඹ නගරයේ බටහිර ප්‍රදේශයේ එන්ආර්ඩබ්ලිව් අඩු කිරීම සඳහා වූ පද්ධති පුනරුත්ථාපන වැඩසටහන බොහෝ දුරට අවසන් වී ඇති අතර ව්‍යාපෘතියේ අනෙක් කොටසේ ප්‍රගතිය පහත පරිදි වේ.

| ව්‍යාපෘති ක්‍රියාකාරකම | ඒකකය | අපේක්ෂිත ඉලක්කය | 2022 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|---|
| කොළඹ නගරයේ දකුණු කොටසේ එන්ආර්ඩබ්ලිව් අඩු කිරීම සඳහා පද්ධති පුනරුත්ථාපනය (අයිසීබී 04) | | | | ලබා දී ඇති කාලය තුළ අපේක්ෂිත ඉලක්කය සපුරා ගෙන නොතිබුණි. | ජලනල එලීම්, පීඩන පරීක්ෂාව, නල පිරිසිදු කිරීම් සහ විෂබීජහරණ කටයුතු බොහෝ දුරට අවසන් කර ඇත. සේවා සම්බන්ධතාවය මාරු කිරීම තවදුරටත් සිදු වෙමින් පවතී. මෙහෙයුම් කටයුතු සඳහා ඩීඑම්ඒ 08 ක් මෙහෙයුම් හා නඩත්තු අංශය වෙත භාර දී ඇති අතර අනෙක් ඒවා පීඉසෙඩ්ටී අවසන් වූ පසු ඉක්මනින් භාර දෙනු ඇත. | නියමිත කාලය තුළ ඉලක්කය සපුරා ගත යුතුය. |
| – පයිප්ප එලීම | මීටර් | 211,032 | 212,093 | | | |
| – සේවා සම්බන්ධතා | නිවාස | 28,882 | 16,323 | | | |
| – ඩීඑම්ඒ ප්‍රගතිය (සම්පූරණ කර ප්‍රාදේශීය සහාය සේවා මධ්‍යස්ථානයන් වෙත භාර දුන්) | නො. | 23 | 01 | | | |
| – කොන්ත්‍රාත්තුවේ සමස්ථ ප්‍රගතිය | ප්‍රතිශතය | 100 | 85.3 | | | |

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| අංකය | විගණන නිරීක්ෂණය | කළමණාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතියේ ප්‍රගති වාර්තාවලට අනුව, අදියර-2 ට අදාළව නිවාස සම්බන්ධතා මාරුවීම් සියයට 57ක් පමණක් අවසන් කර තිබූ අතර, අවසන් කර එන්ඩබ්ලිව්එස්ඩීබී වෙත භාර දිය යුතු ඩීඑම්ඒ 23 න් එකක් පමණක් සමාලෝචිත වර්ෂය අවසානය වනවිට භාර දී තිබුණි. තවද, නිවාස සම්බන්ධතා මාරු කිරීම් 12,559 ක්, මීටර් 140,640 ක පීඩන පරීක්ෂණ කටයුතු, මීටර් 174,098 ක ජල නල සේදීම් හා විෂබීජහරණ කටයුතු මීටර් 149,109 ක ස්ථිර මාර්ග ප්‍රතිස්ථාපන කටයුතු, ඉතිරි ස්ථාපන කපාට කුටි, හරස් මාර්ග ඉදිකිරීම් වැඩ සහ නලමාර්ග විසන්දි කිරීම් වැනි ඉතිරි වැඩ 2023 ජූලි 31 ව්‍යාපෘතිය අවසන් කරන දිනයට පෙර සිදු කළ යුතුව පැවතුණි. | ඉහත 4.1.1 සහ 4.2.2 විස්තර කර ඇති පරිදි පැකේජය 03 සහ පැකේජය 04 යටතේ ඇති වැඩ නිම කර ඇත. කොන්ත්‍රාත්කරුවන් විසින් ඔවුන් විසින් ඉදිරිපත් කරන ලද වැඩ සැලැස්ම අනුව ඉතිරි වැඩ නිම කිරීම අඛණ්ඩව සිදු කෙරේ. මෙම කොන්ත්‍රාත්තු දෙක යටතේ ඇති සියලුම වැඩ 2023 ජූනි 30 වන විට අවසන් කිරීමට නියමිතය. | ව්‍යාපෘතියේ ඉතිරි වැඩ නිම කිරීමට පිළියම් යෙදිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අයිසීබී 03 සහ 04 කොන්ත්‍රාත්තු යටතේ මිලදී ගත් වටිනාකම රුපියල් මිලියන 31.5 ක් වූ ඩීඑම්ඒ මීටර් 25 කොළඹ නගරයේ දකුණු සහ බටහිර කොටසේ පිළිවෙලින් දිස්ත්‍රික් මිනුම් කලාප 19 ක සහ 23 ක ස්ථාපනය කර තිබුණි. ඉන් ඇ.එ.ජ.ඩො. 164,167 ට සමාන රු.මි. 24 ක වටිනාකමකින් යුතු ඩීඑම්ඒ මීටර් 19 ක් අයිසීබී 03 කොන්ත්‍රාත්තුව යටතේ කොළඹ නගරයේ බටහිර ප්‍රදේශයේ ජල ප්‍රවාහ මීටර දත්ත රැස් කිරීම සඳහා ස්ථාපනය කර තිබුණි. කෙසේ වෙතත් 2023 මාර්තු 30 විගණන දිනය වන විට ඉහත ඩීඑම්ඒ මීටර් 25 න් 18 ක් දෝෂ සහිත ලෙස පැවතුනි. | මෙම ගැටළුව විසඳීම සඳහා විසර්ජන බැටරි වෙනුවට නව බැටරි ප්‍රතිස්ථාපනය කිරීමට ව්‍යාපෘතිය කටයුතු කර ඇත. | ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵලය ලබා ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | වසර තුනක වගකීම් කාලයක් සහිතව 2016 සහ 2017 වර්ෂවලදී ඩීඑම්ඒ මීටර් 19 ක් මිලදී ගෙන ඇත. තවද ස්ථාපනය කරන ලද දිනට මීටර් 16 ක වගකීම් කාලය අවසන් වී ඇති බවත්, මිලදී ගත් දින සිට වසර දෙකකට පසු සියලුම මීටර් සවි කර ඇති බවත් නිරීක්ෂණය විය. එසේම සැපයුම්කරු විසින් ලබාදී ඇති, ක්‍රියාත්මක වන දින සිට වසරක නඩත්තු කාලයද ඉකුත් වී තිබුණි. | ප්‍රවාහ මීටර් සවි කිරීම නොවැලැක්විය හැකි ලෙස ප්‍රමාද වූ අතර, ඒවායේ සවිකිරීම් සිදු කිරීමට පෙර වගකීම් කාලය අවසන් විය. | පාඩුව අවම කර ගැනීමට වහාම පියවර ගත යුතුය. |
| (ඈ) | මෙම ව්‍යාපෘතියේ සියලුම ප්‍රසම්පාදන කටයුතු 2024 ඔක්තෝම්බර් 24 දිනට පෙර අවසන් කළ යුතුය. ඉතිරි දිස්ත්‍රික් මිනුම් ප්‍රදේශ 17 සඳහා අවශ්‍ය ඩීඑම්ඒ සහ ලොගර් මීටර මිලදී ගැනීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රවාහ මිනුම් දත්ත සැපයීමේ නොහැකියාව සඳහා හේතුව විසර්ජන බැටරි වේ. කෙසේ වෙතත්, බැටරි ප්‍රතිස්ථාපනය කිරීමෙන් පසු, ප්‍රවාහ මීටර් සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වනු ඇත. | මීටර සවිකිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමට සහ සවිකර ඇති ප්‍රවාහ මීටර නඩත්තු කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඉ) | ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වූයේ එන්ආර්ඩබ්ලිව් අනුපාතය සියයට 18 ට වඩා අඩු මට්ටමක තබා ගැනීම වුවත්, ආදායම් නොවන ජල කළමනාකරණ ඒකකයෙන් ලබාගන්නා ලද දත්තවලට අනුව, අයිසීබී-3 කොන්ත්‍රාත්තුව යටතේ නල එලීම සිදු කරන ලද දිස්ත්‍රික් මිනුම් ප්‍රදේශ 19 ට ඇතුළත් 12 ඒ සහ 22 යන දිස්ත්‍රික් මිනුම් ප්‍රදේශ 2 හි ආදායම් නොවන ජල අනුපාතය සමාලෝචිත වර්ෂය අවසන් වන විට පිළිවෙලින් සියයට 25.80 සහ සියයට 24.88 ක ඉහළ අගයකට ළඟා වී තිබුණි. | ආදායම් නොලබන ජලය (එන්ආර්ඩබ්ලිව්) සඳහා හේතුව පැරණි නලමාර්ග වල කාන්දුවීම් පැවතීම වන අතර කාන්දුවීම් හඳුනාගැනීමේ කටයුතු දැනට සිදුවෙමින් පවතී. කාන්දුවීම් හඳුනාගෙන අලුත්වැඩියා කිරීමෙන් පසු එන්ආර්ඩබ්ලිව් අගය අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. | නීතිවිරෝධී සම්බන්ධතා, කාන්දුවීම් පිළිබඳ ගැටළු නිරාකරණය කිරීමට සහ එන්ආර්ඩබ්ලිව් ප්‍රතිශතය සියයට 18 ට අඩු මට්ටමක තබා ගැනීමට වහාම පියවර ගත යුතුය. |

## 3.3 ව්‍යාපෘති අරමුණු වලින් බාහිර සිදු කරන ලද ක්‍රියාකාරකම්/ගෙවීම්

| විගණන නිරීක්ෂණය | කළමණාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| ව්‍යාපෘතියේ අරමුණුවලට පටහැනිව එන්ඩබ්ලිව්එස්ඩීබී හි මනු කියවීමේ කාර්ය මණ්ඩලයේ නිල ඇඳුම් 1,940 ක් මිලදී ගැනීම සඳහා රු. මිලියන 3.5ක් වැයකර තිබුණි. | නිල ඇඳුම් සඳහා අනුමත ටෙන්ඩර් පටිපාටිය සහ ගෙවීම් ක්‍රියාපටිපාටි ආසියානු සංවර්ධන බැංකුවේ නිසි අනුමැතිය පරිදි සිදු විය. | ව්‍යාපෘති කළමනාකරණය සැම විටම ව්‍යාපෘති විෂය පථය තුළ ක්‍රියාකාරකම් සඳහා ව්‍යාපෘති අරමුදල් යෙදවීමට කටයුතු කළ යුතුය. |

## 3.4 නිෂ්ක්‍රිය / භාවිතයට නොගත් / ඌන උපයෝජිත සම්පත්

| අංකය | විගණන නිරීක්ෂණය | කළමණාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | රුපියල් මිලියන 1,550 ක වියදමින් ඉදිකළ තෙලවල පුහුණු මධ්‍යස්ථානය 2022 දෙසැම්බර් මාසයේදී වාණිජ පදනම මත භාවිතා කිරීමට විවෘත කරන ලදී. 2023 වසරේ පළමු කාර්තුව තුළ මුළු නඩත්තු වියදම හා මුළු ආදායම පිළිවෙලින් රුපියල් මිලියන 7.58 ක් සහ රුපියල් මිලියන 4.32 ක් විය. තවද රුපියල් මිලියන 7.22 ක කාර්යාල උපකරණ සහිත අංගසම්පූර්ණ කායිාල පරිශ්‍රය, පරිගණක විද්‍යාගාර 2ක්, පුස්තකාලයක් සහ මිලියන 4.1 ක් වටිනා ව්‍යායාම උපකරණ වලින් සමන්විත කායවර්ධන මධ්‍යස්ථානය නිෂ්ක්‍රියව පවතින බව නිරීක්ෂණය විය. | පුහුණු මධ්‍යස්ථානය මෙහෙයුම් හා නඩත්තු අංශය වෙත භාර දී ඔවුන් විසින් විවෘත කර තිබුණි. CEWAS හි කළමනාකාරීත්වය විවිධ ක්‍රම හරහා පුහුණු මධ්‍යස්ථානය ප්‍රවර්ධනය කිරීමට සහ ප්‍රචාරණය කිරීමට සක්‍රියව උත්සාහ කරයි. මෙම ප්‍රචාරණ ප්‍රයත්නයන් සාර්ථකව ක්‍රියාත්මක කිරීමෙන්, CEWAS හට අවස්ථා අවස්ථා ලබා ගැනීමට සහ එහි සේවා පරාසය පුළුල් කිරීමට හැකි වේ. | මුළු වත්කම් ඵලදායී ලෙස භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ආදායම් නොලබන ජල ප්‍රතිශතය සියයට 18 ට වඩා අඩු කිරීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය ආරම්භ කර ඇති අතර එය 2022 දී අවසන් කිරීමට නියමිතව තිබුණි. ව්‍යපෘතිය ආරම්භ වූ දින සිට මේ වන විට මාස 99 ගතවී ඇතත් ඩීඑම්ඡ් 42 න් 07 ක් පමණක් සම්පූර්ණයෙන් අවසන් කර එන්ඩබ්ලිව්එස්ඩීබී වෙත භාර දී තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය වෙනුවෙන් ණය ආපසු ගෙවීම් ලෙස රු. මිලියන 2,902.76 ක්, රු. මිලියන 9.27ක් බැඳීම් ගාස්තු ලෙස සහ රු. මිලියන 295.86 ක් පොලී වශයෙන් 2022 දෙසැම්බර් 31 දින වන විට රජය විසින් ගෙවා තිබුණි. | ඡේද අංක 4.1.1, 4.1.2, සහ 4.1.3 යටතේ සපයා ඇති තොරතුරු අනුව, අයිසීබී 03 සහ අයිසීබී 04 කොන්ත්‍රාත්තු යටතේ වැඩ කටයුතු සාර්ථකව නිම කර ඇති අතර, ඉතිරි වැඩ පමණක් සිදු වෙමින් පවතී. ඒඩීබී ණය අවසන් වන විට සියලුම දිස්ත්‍රික් මිනුම් ප්‍රදේශ මෙහෙයුම් සහ නඩත්තු අංශයට භාර දිය හැකි යැයි අපේක්ෂා කෙරේ. | ව්‍යාපෘතියේ අරමුණ ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.5 පෙර විගණන වාර්තාවල පෙන්වා දුන් නොවිසඳී පවතින කරුණු

| විගණන නිරීක්ෂණය | කළමණාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| ව්‍යාපෘතිය යටතේ පාමංකඩ ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය ඉදිකිරීමට නියමිතව තිබූ අතර ඉදිකිරීම් සඳහා ඉඩමක් නොතිබීම නිසා එය ආරම්භ කර නොතිබුණු අතර ව්‍යාපෘතිය නිම කිරීමට පවතින කාලය ප්‍රමාණවත් නොවූ බැවින් නව ඉදිකිරීම් සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙතින් අනුමැතිය ලබා දී නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස **2022** දෙසැම්බර් **31** දින දක්වා ඒ සඳහා දරන ලද උපදේශන ගාස්තු රුපියල් මිලියන **28.19**ක් සහ ඉඩම් අත්පත් කර ගැනීමේ ගාස්තු රුපියල් මිලියන **1.45**ක් ව්‍යාපෘතියට පාඩුවක් බවට පත්ව තිබුණි. | යෝජිත ගොඩනැගිල්ලේ ඉදිකිරීම් තාවකාලිකව අත්හිටුවා ඇත, කෙසේ වෙතත්, අනුමැතිය ලැබුණු පසු මෙම සැලසුම ඕනෑම වේලාවක භාවිතා කළ හැකිය. | නිලධාරීන්ගේ නොසැලකිලිමත්කම නිසා සිදුවන යම් අලාභයන් මූල්‍ය රෙගුලාසිවලට අනුව අයකරගත යුතුය. |

## 3.6 ව්‍යාපෘති පරිපාලනය

| අංකය | විගණන නිරීක්ෂණය | කළමණාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | අයිසීබී-4 කොන්ත්‍රාත්තුව යටතේ **2019, 2020** සහ **2021** වර්ෂවලදී නිම කර කොළඹ මහ නගර සභාවට භාර දුන් මාර්ග **45** ක් සඳහා රුපියල් මිලියන **16.04** ක් වටිනා සුරැකුම්පත් තැන්පතුව අයකර ගැනීමට ව්‍යාපෘතිය මඟින් කටයුතු කර නොතිබුණි. | ඉතිරි සුරැකුම්පත් තැන්පතු අයකර ගැනීමට සඳහා දැනුවත් කිරීමේ ලිපි වරින් වර සීඑම්සී වෙත යවා ඇත. | තවදුරටත් ප්‍රමාදයකින් තොරව තැම්පතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විට ව්‍යාපෘතිය අවසන් කර මාස 6ක් ගතවී ඇතත් රුපියල් 5,434,112 ක වටිනාකමකින් යුත් ස්ථාවර වත්කම් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත පවරා නොතිබුණි. | භාරදීම කටයුතු සිදු වෙමින් පවතී. | වත්කම් විධිමත් ආකාරයෙන් එන්ඩබ්ලිව්එස්ඩීබී වෙත පැවරීමට වහාම පියවර ගත යුතුය. |
| (ඇ) | **2010** ජූලි **26** දින අංක **05** කළමනාකරණ චක්‍රලේඛයට අනුව, ව්‍යාපෘතියේ කටයුතු ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය විසින් විගණනය කර නොතිබුණි. | ඒ පිළිබඳ දැනුවත් වූ අතර අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා අභ්‍යන්තර විගණනයට දැනුම් දෙනු ලැබේ. | අභ්‍යන්තර පාලන ක්‍රියා පටිපාටි පිළිබඳ අභ්‍යන්තර විගණන පැවැත්වීමට කටයුතු කළ යුතුය. |